සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 15 S I |
|---|---|---|

**ක්‍රිස්තියානි ධර්මය - I** — කාලය පැය එකයි

**සැලකිය යුතුයි :-** ● ප්‍රශ්න සියල්ලටම පිලිතුරු සපයන්න. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. ''බොහෝ දෙනා ඔහුගේ උපත නිමිත්තෙන් ප්‍රීති වන්නාහ'' මෙයින් ප්‍රකාශ වන උපත නම්,
1. දාවිත් රජුගේ උපතය. 2. ස්නාවක ජොහාන්ගේ උපතය. 3. ජේසුස් වහන්සේගේ උපතය. 4. මොසෙස්ගේ උපතය.

02. එම්මානුවෙල් යන නාමයේ අර්ථය වන්නේ,
1. දෙවියන් වහන්සේ ඇසුසේකය 2. දේව දායාදය යන්නය
3. ආලේප ලත් තැනන් වහන්සේය 4. දෙවියන් වහන්සේ අප සමගය

03. ස්නාවක ජොහාන් තුමා මනස්ථාපනයට කැඳවන ලද්දේ,
1. පව්කරුවන් පමණක් 2. සැම ජනකොටසක්ම 3. පූජක වරුන් පමණකි 4. ජුදෙව්වන් පමණක

04. ශ්‍රී ලංකික සංස්කෘතික උරුමයන් අනුගමනය කිරීමේදී කිතුනුවා සැලකිලිමත් විය යුතු කරුණ වන්නේ,
1. ඒවා කිතුනු සමාජයෙන් බැහැර කිරීම ගැනය
2. ලාංකික සමාජයේ සෑම චාරිත්‍රයක්ම ඉටුකිරීමට යොමුවීම
3. කිතුනු ඇදහිල්ලට හා ශු බයිබලීය පදනමට පටහැනි නොවීමට
4. විදේශීය චාරිත්‍ර පමණක් අනුගමනය කිරීම ගැනය

05. ජෙරුසලම් දේවමාලිගාවේදී බිළිඳු ජේසුස් වහන්සේ මෙසියස් වහන්සේ බවට හඳුනා ගත්තේ,
1. පරිසිවරු හා නායක පූජකයන් 2. සෙකරියස් සහ සිමියොන්
3. පඬිවුරු හා හෙරෝද් රජුය 4. සිමියොන් සහ අන්නාය

06. ස්නාවක ජොහාන් තුමාගේ කාලයේ උත්තම පූජක තනතුර දැරුවේ,
1. අන්නස්ය 2. කායපස්ය 3. ලෙවීය 4. ඒලීය

07. ''අඳනා දෙකක් ඇති අය නැති අයට දෙත්වා. කෑම ඇති අය නැති අයට දෙත්වා'' මෙයින් අප ලබන පණිවිඩය නම්,
1. සමානාත්මතාවයෙන් යුතු සමාජ පරිසරයක් ගොඩනැගීමය.
2. දන්සල් දීමේ අවශ්‍යතාවයයි.
3. ව්‍යසන අවස්ථාවේදී සහනාධාර ලබා දීමය.
4. ආහාර නැති වූවන් සමඟ තමන්ගේ කෑම වේලක් බෙදාගැනීමය

08. නාසරෙත් හි දේශනාවෙන් පසු ජනතාව කෝප වූයේ ජේසුස් වහන්සේ,
1. ගමේ වැසියෙකු වූ නිසා 2. වඩුවාගේ පුතෙකු වූ නිසා 3. අන්‍ය ජාතීන් අගය කළ නිසා 4. පුදුම ක්‍රියා නොකළ නිසා

09. උත්ථාන වූ ජේසුස් වහන්සේ, දෙවිඳුන් හා ස්වාමීන් ලෙසට අනාවරණය කළේ,
1. පේදුරු තුමා 2. පාවුල් තුමා 3. තෝමස් තුමා 4. ජාකොබ්

10. වර්තමාන සමාජයේ ධර්මදූත සේවයේ යෙදෙන අය
A - වගවලසුන් මැදට ගොස් දහම බෙදා දිය යුතුය. B - දේවධර්මය ගැන නිවැරදි චින්තනයක් දැරිය යුතුය
C - දේව කැමැත්ත මත සාක්ෂි දැරිය යුතුය. D - ගොයම් කැපීමට සූදානම් විය යුතුය.
**මින් වඩාත් නිවැරදි වන්නේ,**
1. A සහ B 2. B හා C 03. A හා D 4. C හා D

11. සමාජයෙන් ප්‍රතික්ෂේපයට ලක් වූවද අසීමිතව ජේසුස් වහන්සේගේ දයානුකම්පාවට ලක් වූයේ,
1. සංකේවුස් හා ලාදුරු රෝගියා. 2. සාකේවුස් සහ පිලාත්. 3. ලාදුරු රෝගියා සහ සිමියොන්. 4. සිමියොන් සහ අන්නා.

12. සබත් දිනය පැවැත්වීම ගැන ජේසුස් වහන්සේ පරිසිවරුන්ගේ විනයධරයන්ට දන්වා සිටියේ,
1. ගතානුගතික පිළිවෙත් වල නිසරු බවය. 2. ව්‍යවස්ථාව ප්‍රතික්ෂේප කල යුතු බවය.
3. මානුෂිකත්වයට ප්‍රමුඛතාවය දිය යුතු බවය. 4. එදින පුද පූජා පැවැත්වීම නොකළ යුතු බවය.

13. පුනර්ජීවනය හා දේවදූතයන් නොපිළිගත්තේ,

1. දිවසිවරුන්ය. 2. පරිසිවරුන්ය. 3. සද්දුසිවරුන්ය. 4. රෝමවරුන්ය.

14. දේව රාජ්‍ය කිසිසේත් ලෞකික රාජ්‍යකට සමාන කළ නොහැකි බව ජේසුස් වහන්සේ පෙන්වා දුන්නේ,

1. උපවාස පිළිබඳ ප්‍රශ්නයේදී ය 2. පුනර්ජීවනය පිළිබඳ ප්‍රශ්නයේදී ය

3. සබත් දින රෝගීන් සුවකිරීමේදී ය 4. අධිරාජ්‍යාට බදු ගෙවීමේ ප්‍රශ්නයේදී ය

15. ජේසුස් වහන්සේ දේව මාලිගාව පවිත්‍ර කිරීමේ සිද්ධියෙන් කිතුනු අපට ලබා දෙන මගපෙන්වීම නම්,

1. ආගමික ස්ථාන වාර්ෂිකව නඩත්තු කළ යුතු බවයි 2. පැරණි දෙව් මැඳුරු නවීකරණය කළ යුතු බවය

3. දේවස්ථානය යාච්ඤාවේ ගෘහයක් ලෙස යොදා ගැනීමය 4. දේවස්ථානය නිරන්තරයෙන් පවිත්‍ර කල යුතු බවය

16. ජේසුස් වහන්සේ එකම රොටිය බෙදාගෙන එකම කුසලානයකින් පානය කිරීමට සැලැස්වීමෙන් සංකේතවත් කළේ,

1. අන් අයට පීඩාවක් නොවන සේ ආහාර ගැනීමය.

2. එදින ආහාර හිගයක් පැවති බවය.

3. සහෝදරත්වය හා සහභාගීත්වය නොකඩවා සිදුකල යුතු බවය.

4. පාස්කු භෝජනය සඳහා එකම රොටියක් හා එකම කුසලානයක් භාවිත කල යුතු බවය.

17. ''මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා'' මේ අනුව ක්‍රියා කරන ඔබ

1. සෑම විටම දේව කැමැත්තට අවනත වීම වැදගත්වේ. 3. අපගේ මිතුරන්ගේ කැමැත්ත පමණක් ඉටුකල යුතුය.

2. අපගේ පෞද්ගලිකත්වයට මුල්තැන දීම අවශ්‍ය වේ. 4. පොදු ජනතාවගේ අපේක්ෂාවන් ඉටුකල යුතුය.

18. ජේසුස් වහන්සේට මරණ දඬුවම ලබාදීමට පිලාත් තීරණය කළේ,

1. තම තනතුර හා වරප්‍රසාදයන් රැකගැනීම සඳහාය. 2. සෑම විටම සාධාරණ තීන්දු ගත් නිසාය.

3. ජේසුස් වහන්සේගේ ක්‍රියාවන් ප්‍රතික්ෂේප කල නිසා. 4. පිලාත් ගලිලයන්ට වෛර කල නිසා.

19. ජේසුස් වහන්සේ ජීවිත පූජාව සිදු වූ මොහොතේ,

**A** - රටපුරා අන්ධකාරයක් පතල විය. B- ශුද්ධාත්ම ආගමනය සිදු විය.

C - දේව මාලිගාවේ තිරය දෙකඩ විය. D - දින ගණනාවක වර්ශාවක් පැවතුනි.

මින් වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,

1. A සහ B 2. B සහ C 3. **C** සහ D 4. A සහ C

20. '' ඔබ දෙවියන් වහන්සේග් ක්‍රිස්තුවරයාණෝය'' යන පේදුරුතුමාගේ ප්‍රකාශයට අනුව අප විශ්වාසය තබන්ගේ

01. සියල්ල සපයන දෙවියන් වහන්සේ කෙරෙහිය. 02. නිරතුරුවම අප සමග ජීවමානව වැඩ සිටින දෙවිදාණන්ය

03.සතුරන් විනාශ කරණ දෙවිදාණන්ය. 04. අපි හිතවතුන්ට වරප්‍රසාධ දෙන දෙවිදාණන්ය.

3

21. වර්තමාන සමාජයේ තුළ කිතුනුවන් විසින් පේදුරුගේ අපලාපය ක්‍රියාවට නන්වන අවස්ථාවක් වන්නේ

1. සත්‍ය හමුවේ මූනිවත රැකීමය 2. මිතුරන් සතුටු කිරීමයි

3. මිතුරන් පවා දීමයි 4. වගකීම් භාරගැනීමට මැලවීම

22. ''ඔවුන් නිහඬ වුවහොත් මේ ගල් මොරගසනු ඇත'' මෙම ප්‍රකාශයට සම්බන්ද සිද්ධිය නම්,

01. නාසරෙත් ධර්මශාලාව විනාශ වීමයි 02. රාජ තේජසින් ජෙරුසලම් දේව මාලිගයට පැමිණීමයි

03. හෙරෝද් ඉදිරියේ විනිශ්චයට ලක් වීමේ අවස්ථාවයි 04. ස්නාවක ජොහාන්ගේ බව්තිස්මයේදීය.

23. ඒකාන්තයෙන්ම සමිඳාණන් වහන්සේ නැගිට සිටින සේක. මෙසේ ප්‍රකාශ කළේ,

1. හිස්වූ සොහොන දුටු දේව දූතයා. 2. සොහොන වෙත ගිය ස්ත්‍රීන්.

3. එම්මාවුස් ගමට යමින් සිටි ගෝලයන්. 4. ගෝලයන් වෙත ගිය පේදුරු.

24. කිතුනු බව්තිස්මය ලැබුවන්

1. ශුද්ධාත්ම අනුහසට විවර වේ. 3. අන් අයගෙන් වෙනස් පුද්ගලයකු බවට පත්වේ.

2. ජලයෙන් හා ගින්නෙන් පවිත්‍රවේ. 4. සමාජයේ වැඩිහිටියෙකු ලෙස පිළිගැනීමක් ලැබේ.

25. ස්නාවක ජොහාන් තුමා සහ ජේසුස් වහන්සේ පෞද්ගලික යාච්ඤා හා භාවනා සිදු කිරීමට තෝරා ගත්තේ,

1. මුහුදු වෙරළයි. 2. සින ගෝගයයි. 3. පාළුකරයයි. 4. නිවසයි.

26. ජේසුස් වහන්සේ තම ගෝලයන් තිවැදි දක්ම කරා යොමු කළ සිද්ධිය නම්,

1. රූප විපර්යාසයයි. 2. ගලීල මුහුදේදිය. 3. කුරුස ගමනේදිය. 4. රේගු පොලේදීය.

27. ලූක් සුබසුනට අනුව තුන්වන පරීක්ෂාව වෙත යොමුවන අවස්ථාවක් වනුයේ,

01. බලය පසුපස යෑම. 02. ලෞකිකත්වයට මුල් තැන දීම. 03. හාස්කම් පසුපස යෑම. 04. ආත්මාර්ථය වෙත යොමු වීම.

28. දේව රාජ්‍ය සියලු ජාතීන්ට උරුම වන්නක් බව ප්‍රකාශ කරන උපමා කතාව වන්නේ,

01. වපුරන්නාගේ උපමාවෙනි. 02. නැති වූ පුත්‍රයාගේ උපමාවෙනි.

03. දැල පිළිබඳ උපමාවෙනි . 04. අබ ඇටය පිළිබඳ උපමාවෙනි.

29. දේව රාජ්‍යයේ වර්ධනය කෙරෙහි බලපාන සාධකය නම්,

01. දේව බලයයි 02. මිනිසාගේ උත්සහයයි 03. අපගේ දැනුමයි 04. විශාල මුදලක් වැය කිරීමයි

30. ක්‍රිස්තුස් වහන්සේ ''මාගේ මෑණියෝත් සහෝදරයෝත් නම් දෙවියන් වහන්සේගේ වචනය අසා පිළිපදින්නෝය''

යනුවෙන් කල ප්‍රකාශයෙන් අදහස් වන්නේ,

01. තම මෑණියන් හා සහෝදරයන් නොසලකා හැරීමය

02. දේව වචනය ඇසීම කෙරෙහි පමණක් අවධයානය යොමු කල යුතු බවය

03. ලේ නෑකම අභිබවා යන තම පවුල් සංකල්පයකි

04. එතුමාට පවුලේ අයගෙන් ඈත්ව සිටීමේ අවශ්‍යතාවයයි

31. පරිසියා හා අයකැමියාගේ උපමාවට අනුව කිතිනුවන් වන අප,

01. තම පාපි ස්භාවය අවබෝධ කරගෙන දේව කරුණාවට නතු විය යුතුය

02. අපගේ වැරදි පූජක තුමා ඉදිරියේ ප්‍රකාශ කල යුතුය

03. තම වැරදි තේරුම්ගෙන නිදහසට කරුණු ප්‍රකාශ කල යුතුය

04. අන් අයගේ වැරදි ප්‍රසිද්ධියේ විවේචනය කල යුතුය

32. තමකම නසා දැමීමට යොමු වන කිතුනුවාගේ යාච්ඤාව විය යුත්තේ,

01. ඉල්ලීම් සියල්ල ලැබේවායි යන්න ය 03. අපගේ වැරදි වලට සමාවුව මැනව යන්න ය

02. ඔබගේ කැමැත්ත වේවා යන්න ය 04. සදාතන දිවිය ලැබේවා යන්න ය

33. ස්වාමින්ගේ යාච්ඤාවට අනුව කමාව ලැබීමට නම්,

01. සමාව සැත්තෑවරක් දානය කල යුතුය 02. වැරදි කරන්නන් බැහැර කළ යුතුය

03. අන් අයගේ වැරදි වලට කමා විය යුතුය 04. අන් අයගේ වැරදි සොයා බැලිය යුතුය

34. ''විශ්වාසි හා අවිශ්වාසී දාසයන්ගේ උපමාවෙන් අවධාරණය කරන්නේ,

01. දාසයන් ලෙස සේවය කිරීමේ වගකීමයි 02. ඕනෑම අවස්ථාවක සූදානම්ව සිටීමේ වගකීමයි

03. තීරණාත්මක අවස්ථාව මගහැරීමය 04. වැටුපට සරිලන සේවයක් ඉටු කිරීමේ වගකීමය

35. හිවලුන්ට බෙනද, අහසේ පක්ෂීන්ට කැදලිද ඇත. එහෙත් මනුෂ්‍ය පුත්‍රයාණන්ට,

01. නිවසක් නොමැත 02. වාසස්තානයක් නොමැත

03. ස්වර්ගයේ නිවහනක් ඇත 04. හිස තැබීමටවත් තැනක් නැත

36. දේව රාජ්‍ය වෙනුවෙන් කඳුළු සලන අයට හිමි වන භාග්‍ය වන්නේ,

01. තෘප්තිමත් වනු ඇත. 02. සිනාසීමට හැකි වීමය 03. පුත්‍රභාවය හිමි වීම 04. දේශය උරුම වීමය

37. නැති වූ කාසිය පිළිබඳ උපමාව අනුව අවධාරණය කරන්නේ

01. දේව රාජ්‍යට පිවිසීම සඳහා අනර්ඝ වස්තුන් අවශ්‍ය බව. 03. දේව රාජ්‍ය යනු සම්පත් බහුල රාජ්‍යක් බව.

02. සෑම පුද්ගලයකුම දේව රාජ්‍යයේ අනර්ඝතම වස්තුවක් බව. 04. පහනක් දල්වා වෙහෙසව කාසි සොයා ගත හැකි බව

38. අපගේ පෞද්ගලික අවශ්‍යතා ගැන කරදර වීමේ නිශ්ඵල බව පෙන්වා දුන්නේ,

01. මිදිවත්ත හා ගොවීන් පිළිබඳ උපමාවෙනි 03. මාර්තා හා මරියාගේ කතාවෙනි

02. අත්තිවාරම් දෙක පිළිබඳ උපමාවෙනි 04. කෙතේ මානෙල් හා අහසේ පක්ෂීන් පිලිබඳ රූපකයෙනි

39. අන් අයගේ ඇදහිල්ල නිසා සුවපත් වූයේ

01. අංශභාග රෝගියා සහ ශාතාධිපතියාගේ දාසියා 02. පේදුරුගේ නැන්දනිය හා ලාදුරු රෝගීන් දසදෙනා ය.

03. මග්දලායේ මරියා සහ අන්ධ බර්තිමේයුස් ය 04. කුදු ස්ත්‍රිය හා මහලේ රෝගී ස්ත්‍රීය

40. දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති මත පිහිටන ක්‍රියා කරන බව,

01. සෑම ඉරු දිනකම නමස්කාරයට සහභාගී විය යුතුය

02. දේව ප්‍රේමය වචනයෙන් හා ක්‍රියාවෙන් එළිදක්විය යුතුය

03. දහම් පාසලේ දරුවන් වෙත දේව වචනය පහදා දිය යුතුය.

04. දේව රාජ්‍ය ගැන දිළිදුන් දැනුවත් කළ යුතුය.

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 15 S II

ක්‍රිස්තියානි ධර්මය - II | කාලය පැය දෙකයි

සැලකිය යුතුයි :- ● පළමු ප්‍රශ්නයටත් තෝරා ගන්නා ලද ප්‍රශ්න 04ක්ද ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

01. (i). ''මෙහෙසුරු දිවැසිවර'' ලෙස හඳුන්වා ඇත්තේ කවුද? එසේ පවසන්නේ කුමන ප්‍රශංසා ගීතයේද?
(ii) ස්නාවක ජොහාන්ගේ නිහතමානී බව අනාවරණය වන ප්‍රකාශයක් ලියන්න
(iii) නාසරෙත් දේශනාවේදී ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ ප්‍රස්තාපිරුළු 02ක් ලියන්න
(iv) අධිරාජ්‍යාට බදු ගෙවීම පිළිබඳ එතුමා එයට දුන් පිළිතුර කුමක්ද?
(v)''ප්‍රේරිත'' යන්නෙහි හා ''පේදුරු'' යන්නෙහි අර්ථය ලියන්න.
(vi) ජේසුස් වහන්සේගේ විනිශ්චය සිදුකල පුද්ගලයින් දෙදෙනක් නම් කරන්න.
(vii) කුරුසපත් ජේසුස් වහන්සේගේ පෙදසින් සිටි සොරුන් දෙදෙනා ගේ ප්‍රතිචාර ලියන්න.
(viii) පාළුකරයේදී ජේසුස් වහන්සේට ඉදිරිපත් වූ දේව පුත්‍රභාවය පිළිබඳ පරීක්ෂා දෙක මොනවාද?
(ix) රූප විපර්යාස අවස්ථාවේදී දෙවියන් වහන්සේගේ වැඩ සිටීම තහවුරු වන සාධක දෙන කුමක්ද?
(x) පරිසිවරයා සහ අයකැමිවරයාගේ උපමා කතාවට අනුව පරිසිවරයා තම ධර්මිෂ්ඨකම තහවුරු කිරීමට ඉදිරිපත් කළ කරුණු 02ක් ලියන්න.

02. (i) ශුද්ධාත්මයාණනගෙන් පූර්ණ වූ එලිසබෙත් මරිය තුමිය හඳුනා ගෙන කරණ ලද ප්‍රකාශයන් 02ක් ලියන්න.
(ii) ජේසුස් වහන්සේගේ දෙමව්පියන් විසින් එතුමා වෙනුවෙන් ඉටු කරන ලද ජුදා චාරිත්‍ර 03ක් ලියන්න.
(iii) ශ්‍රී ලාංකික ජන සමාජයේ පවතින චාරිත්‍ර හා සිරිත් විරිත් කිතුනු විශ්වාසයන්ට පටහැනි නොවන සේ ක්‍රියාවට ගැන්විය හැකි අයුරු නිදනසුන් 03කින් විස්තර කරන්න

03. (i) ජේසුස් වහන්සේ ගලීල මුහුද අසලදී කැඳවන ලද ධීවරයින් තම කැඳවීම කෙරෙහි දක්වන ලද ප්‍රතිචාර 02ක් ලියන්න.
(ii) ධර්මදූත සේවාව සඳහා පිටත් කර යවන ලද 70 දෙනාට පවරන ලද කාර්යයන් 03ක් ලියන්න.
(iii) ජේසුස් වහන්සේ ධර්මදූත සේවයේ යෙදෙන්නන්ට දෙන ලද අවවාද අද සමාජයට වැදගත් වන්නේ කෙසේදැයි කරුණු 05ක් ඔස්සේ විස්තර කරන්න.

04. (i) ජේසුස් වහන්සේ දේව රාජ්‍යයේ වර්ධනය ගැන වදාළ උපමා කතා 02ක් නම් කරන්න.
(ii) දේවරාජ්‍යයේ ලකුණු ලෙස යොදාගත් ප්‍රාතිහාරයන් කාන්ඩ 03ක් නම් කර ඒවාට නිදසුන් බැගින් ඉදිරිපත් කරන්න.
(iii) ඔබේ ජීවිතයේ ප්‍රාතිහාරය අත් දැකීමට නම් ඔබ වර්ධනය කරගත යුතු ගුණාංග 02ක් ලියා ඔබ ලද ප්‍රාතිහාර්යක අත්දැකීමක් ලියන්න.

05. (i) දේව රාජ්‍යයේ පුරවැසියන්ගේ නායකත්ව ධූරාවලියේ ලක්ෂණ 02ක් ලියන්න.
(ii) ජේසුස් වහන්සේ සේවක නායකත්වය ජීවිත ආදර්ශයෙන් පෙන්වූ අවස්ථා 03ක් ලියන්න.
(iii) යහපත් සමාජීය වැසියාගේ කතාවෙන් ඔබේ ජීවිතයට ලැබෙන මගපෙන්වීම් 05ක් නිදසුන් මගින් පැහැදිලි කරන්න.

06. (i) සංකීර්ණ අවශ්‍යතා පසු පස ගමන් කරන ගමන් කරන්නන්ට ජේසුස් වහන්සේ ශරීර ගැන හා ජීවිතය ගැන ලබා දුන් උපදෙස කුමක්ද?
(ii) ජේසුස් වහන්සේ මේ ලෝකයේ සැප සම්පත් හා ධනය ගැන පැවසූ කරුණු 03ක් ලියන්න.
(iii )කිතුනු දරුවෙකු වශයෙන් ඔබට හිමි සම්පත් අන් අයගේ අවශ්‍යතා වෙනුවෙන් කළ අවස්ථා 05ක් ලියන්න.

07. පහත සඳහන් මාතෘකා වලින් දෙකක තෝරාගෙන ශු බයිබලයෙන් උදාහරන සහිතව කෙටි සටහන් ලියන්න.

(i) ආගන්තුක සත්කාරය
(ii) පිදීමේ වැදගත්කම
(iii) ජේසුතුමා පරීක්ෂාවන් ජය ගැනීම
(iv) අත්තිවාරම් දෙක පිළිබඳ උපමාවේ ඉගැන්වීම

# තෙවන වාර පරීක්ෂණය - 2019
# ක්‍රිස්තියානි ධර්මය
10 ශ්‍රේණිය
## පිළිතුරු පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | 02 | 11 | 01 | 21 | 01 | 31 | 01 |
| 02 | 04 | 12 | 03 | 22 | 02 | 32 | 02 |
| 03 | 02 | 13 | 03 | 23 | 03 | 33 | 03 |
| 04 | 03 | 14 | 02 | 24 | 01 | 34 | 02 |
| 05 | 04 | 15 | 03 | 25 | 03 | 35 | 03 |
| 06 | 02 | 16 | 03 | 26 | 01 | 36 | 02 |
| 07 | 01 | 17 | 01 | 27 | 02 | 37 | 02 |
| 08 | 03 | 18 | 01 | 28 | 04 | 38 | 04 |
| 09 | 01 | 19 | 04 | 29 | 01 | 39 | 01 |
| 10 | 02 | 20 | 02 | 30 | 03 | 40 | 02 |

**ක්‍රිස්තියානි ධර්මය - II**

01. (i) ස්නාවක ජොහාන් තුමා - සෙකරියස්ගේ ප්‍රශංසා ගීතය

(ii) ''මට වඩා ආනුභය සම්පන්න උතුමෙක් එන්නේය. එතුමාගේ පාවහන් පටි මුදන්නටවත් මම නොවටිමි.

(iii) ''වෙදතුමාණෙනි, ඔබ ඔබවම සුව කරගන්න. ගමේ දිවසිවරයා ගමට අගේ නැත

(iv) අවංකයන් සේ පෙනී සිටින ඔත්තුකරුවන්ය. සීසර්ගේ දේ සීසර්ටත් දෙවියන් වහන්සේගේ දේ දෙවියන් වහන්සේටත් දෙන්න

(v) ප්‍රේරිත - විශේෂ මෙහෙයක් සඳහා පුහුණු කර යවනු ලැබූ යන්නය.
පේදුරු - පර්වතයන්ය

(vi) නායක පූජක වරයා/ හෙරෝද්/ පිලාත්

(vii) එක් වරදකරුවෙකු උන්වහන්සේ පරීකෂාවකට යොමු කළ අතර අනෙක් වරද කරුවා තමා කළ වරද පිළිගෙන තමාට හිමි දඬුවම සාධාරණ බව ප්‍රකාශ කළේය.

(viii) පළමු පරීකෂාව හා තෙවන පරීක්ෂාවයි

(ix) වලාපටලය සහ අහසින් ඇසුණු හඬ

(x) කාමිත්‍යාචාරී කෙනෙකු නොවීම/ වස්තු ලොභී නොවේ/ වංචනික නොවේ සතියකට දෙවරක් උපවාස කරයි/ දසයෙන් කොටස දෙයි

02. (i) ''ඔබ වනිතාවන් අතර ආශිර්වාද ලද්දීය'' / මාගේ ස්වාමීන් වහන්සේගේ මෑණියන් ලෙසය.

(ii) චර්මච්ඡේදනය, කුළුදුලක් කැප කිරීම, දෙළොස් වියැති ජේසුස් වහන්සේ සමග පෙරුසලම් දේව මාලිගාවට යෑම.

(iii) සිසුන් ලියා ඇති විස්තර කිරීම් 05ක් සඳහා ලකුණු ලබා දෙන්න.

03. (i) ජේසුස් වහන්සේට කීකරු වීම, තම ජීවිත වල දුර්වලතා හා පාපිෂ්ටබව වටහා ගැනීම, ජීවිත වෙනසක් කරා යොමු වීම. සියල්ල අතහැර උන්වහන්සේ පසු පස යෑම

(ii) සේවකයන් ඉල්ලා යාච්ඤා කරන්න, නිවෙස් වලට සාමය පැතීම, රෝගීන් සුව කිරීම, දේව රාජ්‍ය පැමිණ තිබෙන බව දැන්වීම.

(iii) ලෞකිකත්වයට වහල් නොවීම, චාම් පැවැත්මක් පවත්වා ගැනීම, සුභ අස්න පිළිගවන්නන් සමග නැවතී සිටීම. පිළිනොගන්නා අයගෙන් ඉවත් වන්න. පාද වල දූවිලි ගසා දමමින් සාක්ෂියක් දෙමින් ඉවත් වන්න. වර්ථමානයට ගැළපෙන ලෙස ලියා ඇති කරුණු 05ක් සඳහා ලකුණු ලබා දෙන්න.

04. (i) අබ ඇටය පිළිබඳ උපමාව, මුහුන් පිළිබඳ උපමාව, වපුරන්නාගේ උපමාව

(ii) සුව කිරීම.අශුද්ධාත්ම දුරු කිරීම්, ස්වභාව ධර්මය අභිබවා කළ ක්‍රියාවන්, මරණයෙන් උත්ථාන කිරීම.

(iii) දේව රාජ්‍යයේ ආධිපත්‍ය ඇදහිල්ලෙන් පිළිනොගැනීම, දෙවියන් වහන්සේගේ දයාණු කම්පාවට ලක්වීම, විශ්වාසයෙන් ක්‍රියා කිරීම, දේව බලය අත් දැකීමට සූදානම් වීම, අපේක්ෂා වෙන් සිටීම, තම අත්දැකීම සඳහා ලකුණු ලබා දෙන්න.

05. (i) සාමකාමීව සහ සහයෝගයෙන් කටයුතු කරයි. ප්‍රේමයේ ආධිපත්‍ය දරයි, යටත් අයට සේවය කිරීමට නායකයා බැඳී සිටි යටත් අය සේවය ලබයි.

(ii) කුඩා දරුවන් අගය කිරීම, සේවය කිරීමට ඔවුන් වෙත යෑම.ශ්‍රාවකයන්ගේ පාද සේදීම, බොහෝ දෙනෙකු වෙනුවෙන් නිහතමානීව ජීවිතය පිදීම.

(iii) තමාගේ ගමනේ අරමුණු කැප කිරීම, තම කාලය කැප කිරීම, තම ශ්‍රමය කැප කිරීම, තමා සතු සම්පත් අන් අය වෙනුවෙන් කැප කිරීම, ජාති ආගම් වැනි භේද වලින් තොරව ක්‍රියා කිරීම, අසීමිත ලෙස දයා ප්‍රේමය දැක්වීම. වගකීමෙන් නැවත එන ගමනේදී ඔහු ගැන සොයා බැලීම, ආදී වශයෙන් ලියා ඇති නිවැරදි පිලිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.

06. (i) ''කුමක් කමුද කියා ජීවිතය ගැනවත් කුමක් අඳිමුද කියා ශරීරය ගැනවත් කරදර නොවන්න. කෑමට වඩා ජීවිතයද ඇඳුමට වඩා ශරීරයද උතුම් වේ.

(ii) ''ඔබ සිතු දේ විකුණා දන් දෙන්න'' '' නොදිරණ පසුම්භියද නොපිරිගෙන වස්තුන්ද ස්වර්ගයෙහි ඔබට සපයනා ගන්න. '' අහෝ ධනවත් වන ඔබට වන විපතක මහත/ ධනවතෙකු දෙවියන් වහන්සේගේ රාජ්‍යට ඇතුළු වීමට වඩා ඔටුවකුට ඉඳිකටු වලින් රිංගා යෑම පහසුය. ස්වාමිවරුන් දෙදෙනකුට සේවය කිරීමට කිසි සේවකයෙකුට නොපුළුවන/ දෙවියන් වහන්සේට හා වස්තුවට සේවය කරන්න ඔබට නොහැකිය.

(iii) සිසුන් ලියා ඇති කරුණු 05ක් සඳහා ලකුණු ලබා දෙන්න.

07. (i) ආගන්තු සත්කාරය ලූක් 14:7-17 (ii) පිදීමේ වැදගත්කම ලූක් 21:1-4

(iii) ජේසුස් වහන්සේ හා පරීක්ෂාවන් ලූක් 4:1-3 (iv) අත්තිවාරම් දෙක පිළිබඳ උපමාව ලූක් 6:46-49